# මහනුවර නගරාශ්‍රිත සංස්කෘතික උරුමය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**එම්.එම්.එල්. මුලරාජගේ[1]**

ප්‍රමුඛ පදඃ නාගරික උරුමය, මහනුවර නගරය, වොෂින්ටන් ප්‍රඥප්තිය, ශ.දු.අ.ත. විශ්ලේෂණය

## හැඳින්වීම

දෙවන ලෝක යුද්ධයෙන් පසු එළඹෙන දශක කීපය තුළ ලෝකය පුරා ඓතිහාසික නාගරික උරුමයන් වේගයෙන් හායනය වන්නට විය. වැනිස් ප්‍රඥප්තිය (1964) තුළ ද මේ නාගරික උරුමය හා එහි සංරක්ෂණය පිළිබඳ එතරම් අවධානයක් යොමු නොවූ අතර මේ තත්ත්වයට විසඳුමක් ලෙස ICOMOS සංවිධානය විසින් නාගරික උරුමය හා ඊටම විශේෂ වූ සංරක්ෂණ ගැටලු දෙස අවධානය යොමු කරමින් විශේෂ ප්‍රඥප්තියක් ලෙස ඓතිහාසික නගර හා නාගරික ප්‍රදේශ සංරක්ෂණය සඳහා වූ ප්‍රඥප්තිය (Charter for the conservation of historic towns and urban areas-1987) නැතහොත් වොෂින්ටන් ප්‍රඥප්තිය (Washington Charter) හඳුන්වා දෙනු ලැබීය. 1988දී ජගත් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද මහනුවර ඓතිහාසික නගරය හා තදනුබද්ධ නාගරික උරුමයන් පසුගිය දශක කීපය තුළ නූතනත්වය හා සාම්ප්‍රදායිකත්වය අතර ගැටුම් වර්ධනය වෙමින් ආර්ථික, සමාජීය විවිධ ගැටලු හේතුවෙන් විනාශයට යෑමේ අවස්ථා දැකගත හැකිය. ඒ අනුව මහනුවර නගරයේ නාගරික උරුමයේ වර්තමාන තත්ත්වය කෙබඳු ද යන්න මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව විය. වොෂින්ටන් ප්‍රඥප්තිය අනුව මහනුවර ඓතිහාසික නගරය පදනම් කරගනිමින් නාගරික උරුමය හඳුනා ගැනීමත්, තත් උරුමයේ වර්තමාන තත්ත්වය ශ. දු. අ. ත. විශ්ලේෂණය මඟින් හඳුනා ගැනීම සහ එමඟින් තත් උරුමයේ ඓතිහාසික ගති ලක්ෂණ සඳහා බලපෑම් කර ඇති අහිතකර තත්ත්වවලින් උරුමය ආරක්ෂා කර ගැනීමට වොෂින්ටන් ප්‍රඥප්තිය ඇසුරින් යොදා ගත හැකි උපාය මාර්ගික ප්‍රවේශ යෝජනා කිරීමත් 2023 වර්ෂයේ සිදු කරන ලද මෙම අධ්‍යනයේ අරමුණු විය.

## ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණයක් වන මෙහි ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් හා සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස්කළ අතර ද්විතියික මූලාශ්‍රය ලෙස මහනුවර ඓතිහාසික නගරය, නාගරික උරුමය පිළිබඳ රචනා කරන ලද ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි, ප්‍රඥප්ති හා වාර්තා පරිශීලනය කරන්නට යෙදුණි.

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
mohanlakshitha24@gmail.com

එම දත්ත ශ. දු. අ. ත. විශ්ලේෂණය ක්‍රමවේදය හරහා විශ්ලේෂණය කරන්නට විය. එමඟින් මහනුවර නගරයේ වර්තමාන තත්ත්වය ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන යන අංශ මඟින් අනාවරණය කර ගැනීමෙන් පසු මහනුවර නාගරික උරුමයේ ඓතිහාසික ගති ලක්ෂණ සඳහා බලපෑම් කර ඇති අහිතකර තත්ත්වවලින් උරුමය ආරක්ෂා කර ගැනීමට වොෂින්ටන් ප්‍රඥප්තිය ඇසුරින් යොදා ගත හැකි උපාය මාර්ගික ප්‍රවේශ යෝජනා කරන්නට විය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

වොෂින්ටන් ප්‍රඥප්තිය (1987) නාගරික උරුමය යන්න නිර්වචනය කරන්නේ " නගරයක හෝ නාගරික ප්‍රදේශයක වන ඓතිහාසික ගුණාංගවලින් යුත් ආරක්ෂා කළ යුතු ද්‍රව්‍යාත්මක සහ අධ්‍යාත්මික ගතිලක්ෂණ නාගරික උරුමය" වන බවයි. ඒ යටතේ දැක්වෙන සියලුම කරුණු මහනුවර නාගරික උරුමය තුළ අන්තර්ගත බව මෙම අධ්‍යයනය තුළින් හඳුනා ගත හැකි විය. ඒ අනුව මහනුවර නගරය තුළ ද කොටු දැල් නාගරික රටාවක් වෙයි. විශේෂයෙන්ම ක්‍රමවත් මාර්ග/වීදි පද්ධතියකින් නගරය තුළ වන භූමි අවකාශය ජ්‍යාමිතික ආකාරයට බෙදී පවතී. මහනුවර ඓතිහාසික නගරය තුළ වන ගොඩනැගිලි පිළිබඳව අවධානය යොමු කරන විට පෞරාණික නිර්මිත ලෙස සැලකෙන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යා ස්මාරක ලෙස නම් කර ඇති ශ්‍රී දළදා මාළිගාව ප්‍රධාන ගොඩනැගිලි නාමාවලියක් වේ (රාජපක්ෂ, 2021). දළදා මාලිගාවට ඉහළින්ව වන උඩවත්ත කැළය හා දුනුමඬලාව රක්ෂිතය මහනුවර නගරයට අයත් ප්‍රධාන හරිත අවකාශයන් ලෙස නාගරික උරුමයේ වැදගත් අංශයකි. නාගරික උරුමයට අයත් ගොඩනැගිලිවල බාහිර හා අභ්‍යන්තර නිර්මාණ ලක්ෂණ සැලකීමේ දී මහනුවර රජ සමයට අයත් ගොඩනැගිලි බොහොමයක් උඩරට වහලය සහිත සිංහල උළු සෙවිලි කළ, සුදු පැහැති බිත්ති වර්ණාලිප්ත ගොඩනැගිලි වේ. ජගත් උරුමයට අයත් මහනුවර උරුම නගරයේ සීමාවන්ට එපිටින් පිහිටි මහනුවර නගරය හාත්පස සැලකීමේ දී ස්වභාවික නිර්මාණ වන මහවැලි ගඟ, හන්තාන කඳුවැටිය, බහිරව කන්ද ආදිය ද කටුගස්තොට, පේරාදෙණිය හා තැන්නෙකුඹුර ආශ්‍රිත මානව නිර්මිත උරුමයන් ද වොෂින්ටන් ප්‍රඥප්තියට අනුව නාගරික උරුමයේම කොටස් ලෙස හඳුනා ගත හැකිය. ශ්‍රී දළදා මාළිගාව හා සතර මහා දේවාල මඟින් වාර්ෂිකව ජූලි, අගෝස්තු මාසවල පවත්වනු ලබන ඇසළ පෙරහර මංගල්‍යය කාලයක් තිස්සේ අත්පත් කරගත් ක්‍රියාකාරකමක් ලෙස ස්පර්ශීය හා අස්පර්ශීය දෙඅංශයෙන් ම මහනුවර නාගරික උරුමය හඳුනා ගැනීමේ දී ඉතාම වැදගත් බව සඳහන් කළ හැකිය.

මහනුවර නාගරික උරුමයේ වර්තමාන තත්ත්වය ශ. දු. අ. ත. විශ්ලේෂණය හරහා මෙම පර්යේෂණය තුළින් පහත පරිදි හඳුනාගත හැකි විය. ශක්තීන් ලෙස ලෝක පූජිත ශ්‍රී දළදා මාළිගාව නගර මධ්‍යයේ පිහිටා තිබීම, ලෝක උරුම සහ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ගොඩනැගිලි 490ක් මහනුවර නගරය තුළ පිහිටා තිබීම, සංස්කෘතික ත්‍රිකෝණය තුළ සංචාරක කර්මාන්තය තුළින් සේවා අංශය ලද ආදායම 49%ක් වීම, විශේෂ කාලවකවානුවලට අයත් වන සුවිශේෂී

වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත ගොඩනැගිලි නගරය තුළ ව්‍යාප්ත වී තිබීම හා වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යය මහනුවර නගරය තුළ පැවැත්වීම දැක්විය හැකිය. දුර්වලතා ලෙස ලෝක උරුම ගොඩනැගිලිවල පවතින වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ක්‍රමයෙන් හීන වීම, ලෝක උරුම ගොඩනැගිලි සංරක්ෂණය කිරීම සඳහා ශක්තිමත් නීති රීති පද්ධතියක් නොමැති වීම, ඓතිහාසික නගර මධ්‍ය කලාපය තුළ අනුකූල නොවන භාවිතයන් හේතුවෙන් නුසුදුසු පරිසරයන් නිර්මාණය වීම සහ මාළිගාව අවට හා නුවර වැව ආශ්‍රිතව ඉදිකිරීම් සඳහා වැඩි ඉල්ලුමක් පැවතීම ආදිය හඳුනාගත හැකි විය. යුනෙස්කෝ සංවිධානය විසින් 1988 වර්ෂයේදී ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබීම, ජාතික වශයෙන් ප්‍රමුඛතාවයන් ලබා දී ඇති උරුමයන් සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතීන් කිහිපයක් ක්‍රියාත්මක වීම, ශ්‍රී දළදා මාළිගාව හා ඒ අවට ප්‍රදේශය පූජා භූමි ප්‍රදේශයන් ලෙසට නම් කිරීම ආදිය අවස්ථාවන් ලෙස හඳුනාගත හැකිවිය. පැරණි වාස්තු විද්‍යාත්මක ගොඩනැගිලි ඒවායේ මුල් හිමි කරුවන්ගෙන් ගිලිහී යාම හා ස්මාරක හා ගොඩනැගිලි උපක්‍රමශීලීව මුලිනුපුටා දැමීම හෝ අත්හැර දැමීම, නාගරික උරුමයේ වැදගත්කම පිළිබඳ මහජන අවබෝධයක් නොවීම, වායු දූෂණය සහ ශබ්ද ගණත්වය හීනවීමේ පාරිසරික ගැටලු ආදිය මහනුවර නාගරික උරුමයේ වර්තමාන තත්ත්වය තුළ හඳුනාගත් තර්ජනයන් වෙයි.

උක්ත සඳහන් දුර්වලතා හා තර්ජන හේතුවෙන් හායනයට ලක් වෙමින් පවත්නා මහනුවර ඓතිහාසික නාගරික උරුමය ආරක්ෂා කර ගැනීමට වොෂින්ටන් ප්‍රඥප්තියේ අන්තර්ගත ක්‍රමවේද ආශ්‍රයෙන් පහත සඳහන් උපාය මාර්ගික ප්‍රවේශයන් යෝජනා කළ හැකිය. ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, දෘඪ ක්‍රියාමාර්ග වෙනුවට ප්‍රතිසංස්කරණ සහ සංරක්ෂණ කටයුතු සඳහා සහනාධාර ලබාදීම, නාගරික උරුමය සැලසුම්කරණයට ස්ථාපිත මහනුවර ලෝක උරුම නගර උපදේශ කමිටුව ක්‍රියාකාරී ආයතනයක් බවට පත් කිරීම, විධිමත් යාන්ත්‍රණයක් මඟින් නිරන්තරව නිර්මිත ගොඩනැගිලි වල තත්ත්ව පසුවිපරම් කිරීම, පුරාවිද්‍යාත්මක පර්යේෂණ සිදුකර ඒවා ප්‍රකාශන මාර්ගයෙන් ජනගත කිරීම හා නාගරික පාසල් තුළ සිසුන්ට තම උරුමය පිළිබඳ හැඟීම් හා දැනුවත්භාවය ඇති කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**සමාලෝචනය**

මේ අනුව ඓතිහාසික හා පූජනීය වශයෙන් වැදගත් ජගත් උරුමයක් වන මහනුවර නගරයේ, ඓතිහාසික නගර හා නාගරික ප්‍රදේශ සංරක්ෂණය සඳහා වූ ප්‍රඥප්තිය නැතහොත් වොෂින්ටන් ප්‍රඥප්තියට ප්‍රකාරව නාගරික උරුමය හඳුනා ගැනීමේ දී ශ්‍රී දළදා මාළිගාව ප්‍රධාන කොටගත් කේන්ද්‍රීය නගරය හා හාත්පස නගරය ඓතිහාසික හා නවීන යන ලක්ෂණ ද්විත්වයම දරණ නාගරික උරුම වලින් යුක්ත හරිත අවකාශ, විවෘත අවකාශ වැනි දෑ ද අන්තර්ගත ලෝක සංචාරක අවධානයක් දිනාගත් ස්ථානීය අගය ඉහළ නාගරික උරුමයක් ලෙසට නිගමනය කළ හැකිය. තව ද උක්ත නාගරික උරුමය විවිධ හේතු සාධක මත

වර්තමානය වන විට හායනයට ලක්ව ඇති අතර ඒවා සඳහා උපාය මාර්ගික ප්‍රවේශ යෝජනා කිරීම මඟින් බලාපොරොත්තු වනුයේ මහනුවර ඓතිහාසික නගරයේ නාගරික උරුමය එහි සුවිශේෂී ජීව ගුණය ද පවත්වා ගනිමින් සංරක්ෂණය කර මතු අනාගතයටත් ආරක්ෂා කිරීමයි.

## ආශ්‍රිත මූලාශ්‍රය

රාජපක්ෂ, ඒ. (2021). ***උරුම අධ්‍යයන ප්‍රවේශය.*** කොළඹ : සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

සෙනවිරත්න, ඒ. (2013). ***කන්ද උඩරට මහනුවර.*** කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

ICOMOS, (1987). ***The Washington Charter: Charter for the Conservation of Historic Towns and Urban Areas***. Paris: ICOMOS.